## සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය
## සංශෝධන පත්‍රිකා අංක 01

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයට සමරූපීව සකස් කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව, 2017 අගෝස්තු මස 16 දිනැති අංක 2032/26 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 01 අනුව පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

1. **7.3.2.3. වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   7.3.2.3.පළපුරුද්ද
   නියමිත දිනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.
   (මේ යටතේ වූ පැහැදිලි කිරීම එසේම පවතිනු ඇත.)

2. **7.3.2.5 වගන්තිය යටතේ සඳහන් අනුවගන්තීන්හි අවසානයට අනු අංක (iv) ලෙස පහත වගන්තිය ඇතුළත් කරනු ලැබේ.**

   7.3.2.5 වෙනත්
   (iv) නියමිත දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

3. **8.3 වගන්තිය ඉවත් කර පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   8.3 පවත්වන බලධරයා
   සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ආයතනයක්

4. **10.3.1.1. ඡේදයේ (අ) (iii) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කරනු ලැබේ.**

   10.3.1.1 සපුරාලියයුතු සුදුසුකම්
   (අ)(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සමත්, සේවයේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම

5. **10.3.1.2. ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

   10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය
   අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50 %ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කරනු ලබන්නේ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මතය. සීමිත තරඟ විභාගය සමත්වීම සඳහා විභාගයට අදාල එක් එක් විෂයයන්ට අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතික පරීක්ෂා කිරීම සඳහා පමණක් වන අතර එහිදී ලකුණු දීමක් සිදු නොවේ.
   ( විභාග විෂය නිර්දේශය සහ එහි ලකුණු ලබාදීමේ පරිපාටිය 09 ඇමුණුමේ දැක්වේ.)

යොමු අංකය :- CS/ES/13/3/15 1
සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017 . 07 . 25 දින අනුමත කර ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාරවර ලේකම්,
දිනය:- 2017 ...

6. **10.3.2.2. ඡේදය ඉවත් කර පහත ඡේදය ආදේශ කරනු ලැබේ.**

10.3.2.2 උසස් කිරීමේ ක්‍රමය

අධි ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50 %ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කුසලතා පදනම මත සිදුකරනු ලැබේ. මේ සඳහා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයකට මුහුණු දී එක් එක් විෂයන්ට අවම වශයෙන් ලකුණු 40ක් ලබා සමත් විය යුතුය. එහි ප්‍රතිඵල මත හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද පදනම් කරගෙන දෙනු ලබන ලකුණු වල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දෙනු නොලැබේ. ( ඇමුණුම 10)

7. **ඇමුණුම 4 යටතේ ඇති 'සටහන' කොටස වෙනුවට පහත සඳහන් කොටස ඇතුළත් කරනු ලැබේ.**
***සටහන 01***

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉමට අදාල පරිගණක පරීක්ෂණයෙන් පහත අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන් නිදහස් කරනු ලැබේ.

01.පහත ආයතන වලින් ලබාදෙන සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන පරිගණක පාඨමාලාවේ විෂය නිර්දේශයට සමාන විෂය නිර්දේශයක් යටතේ ඇති පරිගණක පාඨමාලා හදාරා ඇති නිලධාරීන්

a.ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)

b.ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

c.වෘත්තීය පුහුණු අධිකාරිය

d.කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල මගින් පවත්වනු ලබන පාඨමාලා

e.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාල හෝ වෙනත් ආයතන

f.ජාතික තරුණ සේවා සභාව

02. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යා උපාධිය හෝ උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති නිලධාරීන්

...කය :- Gs/Es/13/3/15
... පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින්
...ු9.25
.................දින අනුමත කර ඇති බව
...රමි.

17.09.27 ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

සටහන *02*

(2017/8/16 දිනැති ...)

මෙම සංශෝධන ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්කරන දින සිට වසර 02ක කාලයක් දක්වා අංක 1840/34 හා 2013.12.11 දිනැති කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ ඇමුණුම 04 හා සටහනේ ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන නිලධාරින් ද පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

යොමු අංකය : DCS/PT/MA/02/026/2017.

ලේකම්
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 01 අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:..................................
නම:..................................
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත
නිලමුද්‍රාව :.................................. ශරත් පී. කුලරත්න
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත

දිනය: 2017/09/11

---

යොමු අංකය : PPSC/ES/05/FI/06/243.

ආණ්ඩුකාරවර ලේකම්
සබරගමුව පළාත

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 01 අනුමත කිරීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

අත්සන:..................................
නම:..................................
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
නිලමුද්‍රාව :..................................

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

දිනය: 2017/09/13

---

යොමු අංකය : ..................................

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක 01 .................................. දින සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් විසින් අනුමත කරන ලදී. GS/ES/13/3/15

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017.09.25 දින අනුමත කර ඇති බව සහතික කරමි.

අත්සන:..................................
නම:..................................
ආණ්ඩුකාරවර ලේකම්
සබරගමුව පළාත
නිලමුද්‍රාව :..................................

දිනය:- 2017.09.27

ආණ්ඩුකාරවර ලේකම්,
සබරගමුව පළාත.

දිනය: